# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 35 දරන කාසිම් පවුල් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජූලි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 3.50 යි.**

## 2000 අංක 35 දරන කාසිම් පවුල් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 27 වන දින.]

එල්. ඩී.– ඕ. 73/98.

### කාසිම් පවුල් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"කාසිම් පවුල් භාරය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයේ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායි ලෙස කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල්, පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී භාරය පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී භාරයේ භාරකරුවන් විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 35 දරන කාසිම් පවුල් භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන කාසිම් පවුල් භාරයේ දැනට සාමාජිකයන්ව සිටින්නාක් තැනැත්තන් හෝ මෙයින් මතු සංස්ථාපනය කරනු ලබන එකී භාරයේ භාරකරුවන් වශයෙන් බඳවා ගන්නා තැනැත්තන් මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) කාසිම් පවුල් භාරය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද සංස්ථාවට පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය. කාසිම් පවුල් භාරය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) ශිෂ්‍යාධාර අවශ්‍ය ශ්‍රී ලාංකික ශිෂ්‍යයනට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ආ) මූල්‍ය පහසුකම් නොමැතිකම නිසා තම අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කර ගැනීමට නොහැකි දැනට විශ්වවිද්‍යාලවල සිටින විශ්වවිද්‍යාල සිසුනට මුදලින් ආධාර කිරීම ;

(ඇ) අවතැන් වූ අනාථ වූවන්ට සහය වීම ; සහ

(ඈ) වෛද්‍යාධාර අවශ්‍ය පුද්ගලයන්ට සහය දැක්වීම හා උපකාර කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල සංස්ථාවට ඇත්තේ ය.

(අ) කවර හෝ ඇප තැන්පතුවක් මත සංස්ථාවේ පරමාර්ථ සඳහා මුදල් ණයට ගැනීම හෝ මුදල් උපදවා ගැනීම හා සංස්ථාවට සුදුසු යයි සිතෙන කවර හෝ ආකාරයකින් කවර හෝ ණය මුදලක් හෝ බැඳීමක් පියවා දැමීම ;

(ආ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු, සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීම ට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලදී ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ;

(ඇ) සුදුසු යයි හැඟෙන ආකාරයට සංස්ථාවට හදිසියේ අවශ්‍ය නොවන අරමුදල් ආයෝජනය කිරීම හා අවශ්‍ය වන පරිදි කලින් කලට එම ආයෝජන වෙනස් කිරීම හා මාරු කිරීම ;

(ඈ) සියලු ආකාරයේ සාමාජික මුදල්, ප්‍රදාන, පරිත්‍යාග හා තෑගි මුදල් භාර ගැනීම ;

(ඉ) සංස්ථාවේ අරමුණු ජය ගැනීම හා ප්‍රවර්ධනයට ශ්‍රී ලංකාවේ හෝ ඉන් බැහැර කවර හෝ පුද්ගලයෙක්, සමාගමක් හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඊ) පවරනු ලැබූ කවර හෝ කොන්දේසියකට යටත්ව සංස්ථාව විසින් දරනු ලබන හෝ සංස්ථාවට අයිති නිශ්චල හෝ චංචල දේපළකට අදාළ කවර හෝ නීත්‍යානුකූල භාරයක් පරිපාලනය කිරීම ;

(උ) සංස්ථාවේ නිලධාරීන් හා සේවකයන් පත්කිරීම, හෝ පහ කිරීමට අදාළ බලතල පාවිච්චි කිරීම හා සංස්ථාව නිශ්චය කරනු ලබන අකාරයට ඔවුනට වැටුප්, දීමනා හා පාරිතෝෂික ගෙවීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ නිසිලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

**5.** (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, බලතල, කාර්ය, කර්තව්‍ය සහ පැවැත්ම ;

(ආ) රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් කැඳවීම, පැවැත්වීම, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඇ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා වන සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**6.** (1) මෙහි මින් මතු 'භාර අරමුදල' යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් සංස්ථාවට තිබිය යුතු අතර ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, පැවරීමක්, දායක මුදල් හෝ ගාස්තු මගින් ලැබෙන සියලුම මුදල් සංස්ථාව තීරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ බැංකුවක හෝ බැංකුවල සංස්ථාව නමින් තැන්පත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් වියදම් කරන ලද සියලුම මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

(3) සංස්ථාව සතු මුදල් එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා පමණක් යෙදවිය යුතු අතර, එම මුදලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ වෙනත් ආකාරයකින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී පැවති භාරය විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතුව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ ණය සහ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**8.** (1) සංස්ථාවේ සියලු ආදායම් හා වියදම් පිළිබඳව නියි ගිණුම් පවත්වා ගෙන යන බවට සංස්ථාව වගකිව යුත්තේ ය.

(2) සංස්ථාවේ ගිණුම් සෑම වර්ෂයකම එක් වරක්වත් පරීක්ෂා කරනු ලැබ විගණනය කරනු ලැබිය යුතු අතර, ආදායම් හා වියදම් ගිණුමේ නිරවද්‍යතාව සහ ශේෂ පත්‍රය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් වන සහ සංස්ථාව විසින් පත් කරනු ලබන විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරිවේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.